# ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව

# ඇබෑර්තු

## සහකාර අධ්‍යක්ෂ තනතුරු සඳහා (ස්ථිර පදනම මත) බඳවා ගැනීම

**ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ (TRCSL) වෙබ් අඩවියේ පළ කර ඇති ඉහත තනතුරු පුරප්පාඩු පිරවීම සඳහා සුදුසුකම් ලත් අපේක්ෂකයින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.**

**කරුණාකර උක්ත තනතුරු පුරප්පාඩු සඳහා අදාළ සුදුසුකම්, රැකියා විස්තරය සහ වෙනත් අදාළ තොරතුරු පිළිබඳ වැඩිදුර විස්තර දැන ගැනීම සඳහා www.trc.gov.lk වෙබ් අඩවියට පිවිසෙන්න.**

**බඳවා ගැනීමේ ක්‍රමවේදය**

තනතුරු සඳහා තෝරා ගැනීම, ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ බඳවා ගැනීමේ පටිපාටිය මත පදනම් වන අතර අයදුම්කරුවන්ගේ කුසලතා තක්සේරු කිරීමේ ලිඛිත විභාගයකින් අනතුරුව පවත්වන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් තෝරාගැනීම් සිදු කෙරේ. මූලික පරීක්ෂාවකින් පසුව, ලිඛිත විභාගය සඳහා කැඳවනු ලබන්නේ සුදුසුකම් සපුරන අයදුම්කරුවන් පමණි. ලිඛිත විභාගයෙන් වැඩිම ලකුණු ලබා ගන්නා අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.

**අයදුම් කිරීමේ ක්‍රමය**

- **www.trc.gov.lk** වෙත පිවිස මාර්ගගත අයදුම්කිරීමේ ක්‍රියාවලිය පිළිබඳව වන උපදෙස් පරීක්ෂාකාරීව අනුගමනය කරන්න.
- දී ඇති උපදෙස් මාලාව අනුව ඔබගේ මාර්ගගත අයදුම්පත්‍රය ඉදිරිපත් කරන්න
- අයදුම්පත්‍රය පැහැදිලි විය යුතු අතර ඉල්ලා ඇති තොරතුරුවලට අනුකූලව සම්පූර්ණ කළ යුතුය.
- අවශ්‍යතාවන්ට අනුකූල නොවන අයදුම්පත්‍ර සලකා බලනු නොලැබේ.
- තැපැල් මගින් එවන අයදුම්පත්‍ර සලකා බලනු නොලැබේ.
- අයදුම්පත්‍ර භාරගන්නා අවසන් දිනය **2021.08.27** වේ.

**පොදු කොන්දේසි**

1. සෑම අයදුම්කරුවෙකුම ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතු අතර, තනතුරේ රාජකාරි හොඳින් ඉටු කිරීමට සහ දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට ශාරීරිකව හා මානසිකව සුදුසු විය යුතුය.
2. අයදුම්පත් භාරගන්නා අවසන් දිනට අවශ්‍ය සුදුසුකම් සපුරා නොමැති අයදුම්කරුවන්ගේ අයදුම්පත් සලකා බලනු නොලැබේ.
3. ඕනෑම ආකාරයකින් බලපෑම් කිරීම තනතුර සඳහා බඳවා ගැනීමට නුසුදුසුකමක් ලෙස සලකනු ලැබේ.
4. බඳවා ගන්නා තනතුරු සංඛ්‍යාව, බඳවා ගැනීම කල් දැමීම හෝ අවලංගු කිරීම පිළිබඳව තීරණය කිරීමේ අයිතිය ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව (TRCSL) සතුවේ.
5. ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව නියාමන අධිකාරියක් වන අතර, කොමිෂන් සභාවේ තනතුරක් සඳහා බඳවා ගන්නා ඕනෑම පුද්ගලයෙකු ඔහුගේ ඇයගේ කලත්‍රයා හෝ පවුලේ සාමාජිකයකු කොමිෂන් සභාවේ නියාමන පාලනයට යටත් වන ආයතනයක තනතුරකට පත්කිරීම හෝ රැකියාවක නිරතවීම සඳහා සෘජුව හෝ වක්‍රව අනුබල දීම / දිරිගැන්වීම / උපදෙස් දීම සිදු නොකළ යුතුය.


**අධ්‍යක්ෂ ජනරාල්**

**ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව**

**අංක. 276, ඇල්විටිගල මාවත,**

**කොළඹ 08.**